පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
06

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- පෙරදිග සංගීතය

පාසලේ නම : ..............................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 2 යි

## I කොටස

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) සංගීතයේ මාධ්‍යය වන නාද ප්‍රධාන වශයෙන් කොටස්,

(i) දෙකකි (ii) තුනකි (iii) හතරකි (iv) පහකි

02) ආරෝහණ ක්‍රමයට සකස් කළ ස්වර ඛණ්ඩය වනුයේ,

(i) ස ග රි ග (ii) ම ග රි ස (iii) ස රි ග ම (iv) ප ම ග රි

03) ස, ග, ප යන ස්වර බටහිර සංගීතයේ හඳුන්වන්නේ පිළිවෙලින්

(i) B,C,D (ii) C,E,G (iii) C,D,E (iv) C,G,E

04) සුෂිර වාද්‍ය භාණ්ඩයකි

(i) පියානෝව (ii) සිතාරය (iii) වයලීනය (iv) සර්පිනාව

05) විද්‍යුත් මාධ්‍යයන්හි ප්‍රචලිත ළමා ගීතයක් නොවන්නේ,

(i) ආදරේ ඇයි පොඩි හඳ මාමේ (ii) සෙන්පතියන් ගැන

(iii) අද වෙස්සන්තර රාජ පුතා (iv) ඉරෙන් හඳෙන්

- **පහත රූප සටහන ඇසුරෙන් 6 සිට 8 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**



A B C D E F

06) මුරලි හා බන්සුරි ලෙස වර්ග දෙකකින් යුත් වාද්‍ය භාණ්ඩය වන්නේ,

(i) A (ii) B (iii) C (iv) D

07) දායාං හා බායාං ලෙස කොටස් දෙකකින් යුත් වාද්‍ය භාණ්ඩය වන්නේ,

(i) A (ii) B (iii) C (iv) D

08) මෙම භාණ්ඩයේ තත් වාදනය කරන්නේ මිස්රාබ් නම් උපකරණයෙනි

(i) B (ii) C (iii) E (iv) F

09) /සසගග/රිරිග-/සසරිරි/ග---/ යන ස්වර පාදය අයත් ශුද්ධ ස්වර ස්ථාපන ගීතය වන්නේ,

(i) බැතිනා සිරිපා (ii) කඳු කඳු නැගෙනා

(iii) කඳු පෙළ අතරේ (iv) හොඳ දේ හිතමී

10) නරි බෑණා නාට්‍යය නිෂ්පාදනය කළේ,

(i) ආනන්ද සමරකෝන් මහතා ය (ii) දයානන්ද ගුණවර්ධන මහතා ය

(iii) ජෝන් ද සිල්වා මහතා ය (iv) චාල්ස් ඩයස් මහතා ය

- **අංක 11 සිට 15 දක්වා වගන්ති හරිනම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.**

11) "තාරාවා" යන්නෙහි ලඝු මාත්‍රා ගණන 6 කි ( )

12) "සුවඳ පත්ම ඕළු ආදී" ගීතය අයත් වන්නේ වෙස්සන්තර නූර්තියට යි. ( )

13) ඉන්දියානු ජාති ගීයේ නිර්මාතෘවරයා රවීන්ද්‍රනාත් තාගෝර්තුමා ය ( )

14) "තෝව දෙන්නෙත් නරියටයි" යනු රබන් පදයකි ( )

15) ගොක් කොළ නලාව ආදේශක භාණ්ඩයකි ( )

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට සුදුසු පද වරහන් තුළින් තෝරා වගන්ති සම්පූර්ණ කරන්න.**

(මේවර කෙළිය, ජෝන් ද සිල්වා, ඔළිඳ කෙළිය, ලයනල් අල්ගම, තුන් සරණේ ගී)

16) "සාර සදිසි පෙති පේර නෙළන කල" ගීතය ……………………………. ට අයත් ගීතයකි.

17) නූර්ති නිෂ්පාදකයෙකු ලෙස ……………………………. මහතා ප්‍රකට ය.

18) නරි බෑණා නාට්‍යයේ සංගීත අධ්‍යක්ෂණය කළේ …………………………….මහතා ය.

19) කාන්තාවන්ට සුවිශේෂ වූ ක්‍රීඩාවක් ලෙස ……………………………. නම් කළ හැකිය.

20) "සීත ගඟුලෙදී ඇඟ පේවෙනවා" ගීතය ……………………………. ගීතයකි.

(20 x 2 ලකුණු 40)

## II කොටස

- තෝරා ගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01)

i) ස්වර පුවරුවක් ඇඳ බටහිර ක්‍රමයට එහි ස්වර සප්තකය ලකුණු කරන්න. (ලකුණු 6)

ii) ඔබ ඉගෙන ගත් ශුද්ධ ස්වර ස්ථාපන ගීතයක්, ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 6)

02)

i) දේශීය ජන ක්‍රීඩා 04 ක් නම් කරන්න. (ලකුණු 4)

ii) ඉන් එක් වර්ගයකට අයත් ගීතයක් ලියන්න. (ලකුණු 4)

iii) ඉහත නම් කළ ජන ක්‍රීඩාවන්ගෙන් එකක් පිළිබඳව කරුණු 04 ක් ලියන්න. (ලකුණු 4)

03)

i) "බැතිනා සිරිපා කරුණා කරනා" මෙම ගී පාදයෙහි ලඝු අකුරු ගණන හා ගුරු අකුරු ගණන වෙන වෙනම ලියන්න. (ලකුණු 2)

ii) ඉහත ගී පාදය මාත්‍රා 4 න් 4 ට තාල යෙදෙන සේ ප්‍රස්තාර කරන්න. (ලකුණු 4)

iii) තුන් සරණේ ගී පිළිබඳව කරුණු 02 ක් ලියන්න. (ලකුණු 2)

iv) ඔබ ඉගෙන ගත් තුන් සරණේ ගීතයක් ලියන්න. (ලකුණු 4)

04)

i) භාරතීය ප්‍රධාන සංගීත පද්ධති 02 ක් නම් කරන්න. (ලකුණු 2)

ii) නූර්ති රංග සම්ප්‍රදාය පිළිබඳව කරුණු 04 ක් ලියන්න. (ලකුණු 4)

iii) ඔබ ඉගෙන ගත් නූර්ති ගීතයක් සම්පූර්ණයෙන් ලියන්න. (ලකුණු 6)

05)

i) පිඹීමෙන් හා සෙලවීමෙන් හඬ නිපදවා ගන්නා ආදේශක භාණ්ඩ 02 ක් පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 2)


ii) ඔබ විසින් සකස් කළ ආදේශක සංගීත භාණ්ඩයක් ඇඳ එය සැකසූ අයුරු විස්තර කරන්න. (ලකුණු 10)

06)

i) ඔබ ඉගෙන ගත් සංගීත භාණ්ඩ 02 ක් පිළිබඳව කරුණු 03 බැගින් ලියන්න. (ලකුණු 06)

ii) ඔබ ඉගෙන ගත් ළමා ගීතයක් සම්පූර්ණයෙන් ලියන්න. (ලකුණු 06)

07. පහත සඳහන් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න. (ලකුණු 12)



**හරහට**

1. තත් හතරකි. බෝවෙන් වයයි.

3. "සුළඟේ ආධාරයෙන් නාදය උපදවන" යන අර්ථය දෙයි.

5. නිකුත් වන මොහොතේ ම අපට ඇසෙන නාද

7. හින්දුස්ථානි සංගීතයේ ප්‍රධාන ස්වර වාද්‍ය භාණ්ඩය යි.

10. සංගීතයේ මාධ්‍යය මේ නමින් හඳුන්වයි.

11 ස්වර හතට කියන තවත් නමකි.

**පහළට**

2. නැති වූ ආභරණයක් සෙවීම පිළිබඳ ජන ක්‍රීඩාවකි.

4. ගිටාරයේ තත් ගණන

5. අපේ ජාතික ගීයේ නිර්මාතෘවරයාගේ නම

6. උච්ඡාරණය කිරීමට මාත්‍රා 03 ක කාලයක් ගතවන අක්ෂර

8. සිරස් අතට තබා වයන බටනලා මේ නමින් හඳුන්වයි

9. "උඩපල ගත්තත් වට්ටක්කා" යන පද වයන භාණ්ඩය

# LOL.lk
## BookStore

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

### ඕනෑම පොතක් ඉක්මනින්
### නිවසටම ගෙන්වා ගන්න





| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**